**ශීර්ෂය 2 – අග්‍රාමාත්‍ය කාර්යාලය**

------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------

**1.1 මතය**

---------

ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

--------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය එලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මාවිසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 2.1 වියදම් කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 02 ක් සඳහා එකතුව රු.72,000,000 ක අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.58,960,867 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.13,039,133 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයට සලසා තිබුණ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 54 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි කාර්යයන් නිම කිරීමට අපහසු වීම, විදේශ ගමන්වල යෙදීම සීමා වීම හා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළව රු.20,691,587 ක බැරකම් දක්වා තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල වූ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ එම බැරකම් දක්වා නොතිබුණි. | 2021 වර්ෂයට පෙර වර්ෂයන්හි අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ පැවති උප කාර්යාලයක් වන සංහිදියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයට (SCRM) අදාළ වන බැවින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුළත් නොකරන ලදි. | බැරකම් ප්‍රකාශයේ සියලුම බැරකම් දැක්වීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 3.1 කාර්යසාධනය

---------------

(අ) රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආර්ථිකය ගොඩනැගීමේ වැඩපිළිවෙළට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම ප්‍රමුඛතම කාර්යයක් ලෙස හඳුනාගෙන, ඒ අනුව ප්‍රාදේශීය වශයෙන් සපයන සේවාවන් හා ඒවායේ විෂය පථයන්ගේ සම්බන්ධතාවය සැලකිල්ලට ගෙන රාජ්‍ය අමාත්‍යාංශ හා තෝරා ගත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සම්බන්ධිකරණය යටතේ පහත සඳහන් කමිටු 04 ක් ඇති කර තිබුණි.

- සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
- ජීවනෝපාය සංවර්ධන කමිටුව
- දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව
- ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

මූලික අදියර වශයෙන් ඉහත සෑම කමිටුවක් විසින්ම එක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමක් බැගින් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රැස්වීම් පවත්වා එහිදි ඉදිරිපත් වන ගැටළු සඳහා විසඳුම් ලබාදීම අපේක්ෂා කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කමිටුව සඳහා එක් එක් දිස්ත්‍රික්කවල පැවති රැස්වීම්වලදී ඉදිරිපත් වූ මුළු ගැටළු සංඛ්‍යාව 2,562 ක් වී තිබුණි. රැස්වීම් අවස්ථාවේදීම ගැටළු 286 ක් විසඳා තිබුණු අතර, ඉදිරිපත් වූ ගැටළු වලින් ගැටළු 2,276 ක් විසඳීම සිදු කළ යුතුව තිබුණි. ගැටළු විසඳීමේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. | කාර්යසාධනය උපරිමව ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | මෙම වැඩපිළිවෙළ තුළින් ප්‍රාදේශීය වශයෙන් අදාළ ගැටළු හඳුනාගෙන ඒකාබද්ධ සංවර්ධන යාන්ත්‍රණයක් ඇතිකර ඒ තුළින් ප්‍රාදේශීය හා ජාතික සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අපේක්ෂාව වී තිබුණි. ඒ අනුව, අධික පිරිවැයක් දරමින් දිස්ත්‍රික් රැස්වීම් පවත්වා තිබුණ ද, ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහන් පිළිබඳ යෝජනාවන් ඉදිරිපත් කිරීමට හෝ වැඩපිළිවෙළවල් සකස් කිරීමට ක්‍රියාත්මක වී නොතිබුණි. | 2022 වසරේ අයවැය මගින් මුදල් වෙන් කිරීම උදෙසා මෙම තොරතුරු පාදක කර ගැනීම සිදු කර ඇත. | කාර්යසාධනය උපරිමව ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | තරුණ දිළිඳුකම දීර්ඝකාලීනව තුරන් කිරීම සඳහා නූතන වෙළඳපොළ හා තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් විධිමත් වැඩපිළිවෙළක් දියත් කිරීම හා තරුණ ප්‍රජාව සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘතියක් දියත් කිරීමට 2021 අප්‍රේල් මාසයේදී සාකච්ඡා ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා ගන්නා ආකාරය, අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය, මුළු ව්‍යාපෘතියම ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම, සැලසුම් කිරීම, ව්‍යාපෘති | මෙම වැඩසටහන තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් සිදු කිරීමට කටයුතු කරන ලද බැවින් ව්‍යාපෘති යෝජනාව අදාළ අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශයේ ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2021 දෙසැම්බර් 23 දින යවා ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිශ්චිත සැලසුමකට අනුව සිදු කළ යුතු වීම. |

ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය පිළිබඳ කරුණු ඇතුළත් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වාර්තා පිළියෙළ කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. 2022 මැයි 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් ආයතන වෙතින් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබා දී තිබුණු වාහන 11 ක් විධිමත් පරිදි කාර්යාලයට පවරාගෙන නොතිබුණි. | වාහන 07 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රවාහන සංචිතයේ හා අරලියගහ මන්දිර පරිශ්‍රයේ පවතින බවත්, වාහන 02 ක් ප්‍රභූ ආරක්ෂක සංචිතයේ හා V වන විධායක ජනාධිපතිගේ ප්‍රවාහන සංචිතය තුළ පවතින බවත්, එක් වාහනයක් හිටපු අග්‍රාමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ පුද්ගලයෙකු වෙත පවතින අතර ඉතිරි වාහනය අලුත්වැඩියාවක් සඳහා ගරාජයක පවතී. | විධිමත් පරිදි වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක. 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පොදු 47 ආකෘතිය යටතේ, භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට ප්‍රථම සුදුසු පරිදි කටයුතු කර, නිම කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව භාවිතයට ගත නොහැකි භාණ්ඩ අයිතම 905 ක් සම්බන්ධව කටයුතු 2022 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි. | රට තුළ පැවති උග්‍ර ඉන්ධන හිඟය නිසා නියමිත කාල වකවානු තුළ අපහරණ කටයුතු සිදු කිරීමට අපහසු තත්ත්වයන් ඇති විය. | භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව විධිමත් පරිදි නොපමාව කටයුතු කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දින වන විට කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 104 ක් පුරප්පාඩුව පැවතුණු අතර, එම පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂය තුළදී අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සාමාන්‍ය ක්‍රමවේදය ඔස්සේ නිලධරයන් ස්ථාන මාරු කර ගැනීම සිදු කිරීමට ඇතිවූ ප්‍රායෝගික අපහසුතා හේතුවෙන් කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම කාර්යාලයේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුයුක්තව සිටි නිලධාරියෙකු වෙනත් ආයතනයකට නිදහස් කර තිබුණත්, එම නිලධාරියාට 2021 වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.573,248 ක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ගෙවා තිබුණි. | ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීම අනුව තාවකාලිකව නිදහස් කර ඇත. | සේවය කරන ආයතන වලින් වැටුප් හා දීමනා ලබා ගැනීමට හැකි වන පරිදි විධිමත් ලෙස මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. |